# රත්නපුර බඹරගල ආරණ්‍ය සේනාසනය පිළිබඳ සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් සිදුකෙරෙන අධ්‍යයනයක්

ආර්.ඩබ්ලිව්.සී. මදූෂානි[1]

රත්නපුර දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන බඹරගල ආරණ්‍ය සේනාසනය අප්‍රකට පුරාවිද්‍යා ස්ථානයකි. මෙය ක්‍රි.පූ දෙ වැනි සියවසට අයත් වේ. මෙම ස්ථානය පිළිබඳ ජනප්‍රවාදාත්මක හා පුරාවිද්‍යාත්මක වශයෙන් තොරතුරු රැසක් අනාවරණය කරගත හැකිය. ජනප්‍රවාදාත්මක තොරතුරුවලට අනුව මංගර නම් ප්‍රාදේශීය රජ කෙනෙකු හා ඔහුගේ බිසව මෙහි වාසය කර ඇති බවට විශ්වාසයක් පවතී. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ බඹරගල ආරණ්‍ය සේනාසනය පිළිබඳව සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය මගින් තොරතුරු අනාවරණය වනවා ද නැද්ද යන්න අධ්‍යයනය කිරීමයි. මෙහිදී ස්ථානීය ගවේෂණය යටතේ ක්ෂේත්‍රය තුළ සංචාරය කිරීම, දත්ත හඳුනාගැනීම, වාර්තා කිරීම සහ පුස්තකාල ගවේශණය සිදු කරන ලදි. මෙහි ක්‍රි.පූ 2 වැනි සියවසේ සිට සියවස් කිහිපයකට අයත් ශිලාලේඛන කිහිපයක් එහි දැකගත හැකිය. ඒවායින් එකල පැවති සමාජ ක්‍රමය සහ අක්ෂර භාවිතය පිළිබඳව හඳුනාගත හැකිය. බෝධිය ඉදිරියේ වූ ගලක ලියා ඇති පළමු ශිලාලේඛනය ක්‍රි.ව 12 වැනි සියවසට අයත් "අනතේනිසා (මි)" "අමීගේ ගල්ගේ", යනුවෙන් බ්‍රාහ්මී අක්ෂරයෙන් පේළි දෙකකට ලියා ඇත. දෙ වැනි ශිලාලේඛනය පළමු වැනි ලෙනෙහි කටාරය අසල "උපතිශහ" "උපතිස්සයන්ගේ ගල්ගේ" ලෙස දැක්වේ. මෙය පෙර සඳහන් කළ ශිලාලේඛනයට වඩා පැරණිය. කටාර කෙටූ ලෙන් රාශියක් ද දැකගත හැකි වන අතර ඒවායේ භික්ෂූන් වහන්සේලා වාසය කර ඇත. බඹරගල ආශ්‍රිත වෙහෙරගොඩැල්ල වැදගත් ස්ථානයකි. මෙහි ගරාවැටුණු ගොඩැලි පිරිවර කොට ඇති හෙයින් වෙහෙරගොඩැල්ල නමින් ව්‍යවහාර කර තිබේ. එමෙන්ම ගඩොලින් බඳින ලද චෛත්‍යයක, විහාරයක, ධර්මශාලාවක හා තවත් ගොඩනැගිලි කිහිපයක නටඹුන් හමු වී තිබේ. අනුරාධපුර හෝ පොළොන්නරු යුගයට අයත් යැයි උපකල්පනය කළ හැකි ශෛලමය හිටි බුදු පිළිමයක් හමු වී ඇති අතර එය අඩි 10-12 පමණ උසය. අද වන විට පිළිමය ශේෂව ගොස් ඇත. මෙම ස්ථානයේ මුරගලක් , කොරවක් ගල් කිහිපයක් ද වන අතර එමගින් මෙහි සංඝාවාසයක් පවතින්නට ඇතැයි උපකල්පනය කළහැකි පුරාවිද්‍යාත්මක සාධක කිහිපයක් හමු වේ. ගල්පඩි යොදා ඇති ආකාරයෙන් ද ඒ බව නිගමනය කළ හැකිය. එමෙන්ම මෙහි චෛත්‍යක නටඹුන් දැකගත හැකිය. චෛතය වටා විශාල ගල් වැටක් ද තිබී ඇති බැවින් මෙය සුවිශාල චෛතයක් බව උපකල්පනය කළ හැකිය. මෙහිදී නිගමනය කළ හැකි වන්නේ වසර 2300 කට වැඩි ඉතිහාසයක් සහිත බඹරගල ආරණ්‍ය සේනාසනයේ ඓතිහාසිකත්වය සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් තහවුරු කරගත හැකි බවය .

ප්‍රමුඛ පද : බඹරගල, ශිලාලේඛන, වෙහෙරගොඩැල්ල, පුරාවිද්‍යාත්මක සාධක

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.chathurikam658@gmail.com